www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ග්‍රීක වැඩවර්ජන හා නය අර්බුදය ආර්ථික කඩාවැටීමක බිය උත්සන්න කරයි.

## Greek strikes, debt crisis intensify fears of economic collapse

**ඇලෙක්ස් ලැන්ටියර් විසිනි.**
**2010 අප්‍රේල් 21**

ග්‍රීක ආන්ඩුවේ නය මත පොලී අනුපාත දිගටම ඉහල දමමින් ප්‍රධාන බැංකු සහ ආයෝජකයෝ ග්‍රීසියේ හෙටදවසේ වැඩවර්ජන කරා ගමන් කරමින් සිටින්නේ යුරෝපීය-ජාමූඅ ඒකාබද්ධ ඇපදීමේ සැලසුම් බිඳවැටේය යන බියසංකා අලුත් කරමිනි.

නය අර්බුදය උත්පාදනය කල යටින් දිවෙන ආර්ථික ප්‍රශ්න ඇපදීමෙන් නොවිසඳෙන බව මූල්‍ය කවයන් තුල පුලුල්ව උපකල්පනය කෙරෙන අතර යුරෝපීය පාලකයෝ සහ මාධ්‍ය, රාජ්‍ය බංකොලොත්භාවය හෝ පොදු යුරෝපීය මුදල් ඒකකය වන යූරෝ හි අවසානය හෝ සම්බන්ධව සාකච්ඡා වර්ධනය කරමින් සිටිති.

ග්‍රීසියට තමන්ගේ නය ආරක්ෂාකාරීව ප්‍රතිමූල්‍යකරනය කල හැකි බවට ආයෝජකයන් විශ්වාස කරන අනුපාතයකට වඩා වැඩි අගයකට ලඟාවෙමින්, ඊයේ දිනයේදී දස අවුරුදු නය සඳහා ග්‍රීසිය ගෙවන පොලී අනුපාතය සියයට 7.807 ක වාර්තාගත අගයකට ඉහල ගියේය. පැරනි නය නොගෙවීමෙන් වැලකීමට මැයි අග දී ග්‍රීසිය යුරෝ බිලියන 10 ක් උපයා ගත යුතුය.

ඇපදීමක හැකියාව ගැන දින 10 ක සාකච්ඡාවකට යුරෝපීය සහ ජාමූඅ නිලධාරීන් ඇතැන්ස් බලා එන බව ග්‍රීක මුදල් ඇමති ජෝර්ජ් පපාකොන්ස්තන්තිනෝ ප්‍රවෘත්ති සාකච්ඡාවකදී පැවසීය. "නය ලබාගැනීමේ තත්වය සහ ඇතැන්ස්හි සාකච්ඡාවල ප්‍රගතිය" යන කාරනා දෙකම මත ඇපදීම ඉල්ලා සිටීමේ තීරනය රඳපවතින බව ඔහු පැවසීය. එක්සත් ජනපදයේදී (එජ) අරමුදල් එකතුකිරීමට උත්සාහකිරීමට "මාර්ග ප්‍රදර්ශනයක්ද" සැලසුම් කර ඇති බව ඔහු කීවේය.

කෙසේ වුවද, ඇමෙරිකානු සහ ආසියානු මූල්‍ය වෙලඳපොලෙන් නය ලබාගැනීමට ග්‍රීසියට හැකියාව පවතින බවට ඇති අවිනිශ්චිත බව ඉහල යමින් තිබේ. නිව්යෝක් මෙලන් බැංකුවේ සිමොන් ඩෙරික් උපුටා දක්වන ඩේලි ටෙලිග්‍රාෆ්, "චීනය යුරෝපය ගැන සැලකිල්ල යොමු කරමින් සිටී. තම නය මිලදීගන්නට කිසිවෙකු හෝ සෙවීමේ අරගලයකට ග්‍රීසිය යොමුවෙමින් සිටී. ආසියාවේ මාර්ග ප්‍රදර්ශනයක් නැති අතර එජයේ පවත්වන්නට යන ප්‍රදර්ශනයෙන්ද ඔවුන් ඉවත් වේවි."

වැඩිදුරටත්, යුරෝපීය සහ ජාමූඅ නය සමගින්වත්, ග්‍රීසියට තම නය ආපසු ගෙවන්නට නොහැකි වන බව මූල්‍ය විචාරකයෝ වැඩිවැඩියෙන් අපේක්ෂා කරති. යුරෝ බිලියන 45 ක පමන ඒකාබද්ධ යුරෝපා-ජාමූඅ ඇපදීමකට සාකච්ඡා කරන අතරේදී, ජර්මානු මහ බැංකු අධිපති ඇක්සල් වෙබර් යුරෝ බිලියන 80 ක් අවශ්‍ය වන බව මෑතකදී පැවසීය. ජර්මානු නීති සම්පාදකයින්ගේ රහස් රැස්වීමකදී ග්‍රීසියේ තත්වය වඩා නරක අතට හැරෙමින් පවතින බවත් "සැමවිටම සංඛ්‍යා වෙනස් වෙමින් පවතින බවත්" පැවසීය.

*ෆයිනැන්ෂල් ටයිම්ස්හි* කොලමක වොල්ෆ්ගැන් මන්චාවු මෙසේ ලිවීය. "ග්‍රීසියේ නය බරට දල දේශීය නිෂ්පාදනයේ අනුපාතය සියයට 125 කි. පවතින නය සහ පොලී ගෙවා නිමකරන්නට ඊලඟ වසර පහ තුලදී, එක් වසරකට ආසන්නව යුරෝ බිලියන 50 (ඩොලර් බිලියන 68, පවුම් බිලියන 44) මුදලක් ග්‍රීසිය උපයාගන්නට අවශ්‍යය. මෙය එකතු කලවිට ආසන්නව යුරෝ බිලියන 250 ක් හෝ ග්‍රීක දදේනි යෙන් සියයට 100 ක් වේ." ඔහු මෙසේ ලිපිය අවසන් කලේය. "ගලවාගැනීමේ පැකේජය ගැන ඔබට පවසන්නට ඇති හොඳම දෙය නම්, එය ක්‍රමානුකූලව නයගෙවීම් පැහැර හැරීමකට කාලය මිලට ගැනීමකි."

ග්‍රීක සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පැසොක් පක්ෂයේ අගමැති ජෝර්ජියෝ පැපැන්ඩ්‍රියෝ විසින් බලාත්මක කරන ලද කප්පාදු පිලිවෙත්වලට එරෙහිව ග්‍රීක කම්කරුවන් තවදුරටත් වැඩවර්ජනවලට සූදානම්වෙද්දී, මෙම අදහස් ඉදිරියට පැමිනේ. මාසයක්ම පැපැන්ඩ්‍රියෝට එරෙහිව ක්‍රියාමාර්ග ගැනීම ප්‍රතික්ෂේප කිරීමෙන් පසු, රාජ්‍ය අංශ වෘත්තීය සමිතිය වන ADEDY සහ අද දිනද වර්ජනයකට කැඳවුම් කර ඇති ස්ටැලින්වාදී PAME වෘත්තීය සමිතිය අප්‍රේල් 22 වන බ්‍රහස්පතින්දාට වර්ජනයකට කැඳවුම් කරති. "මෙම මස අගදී"

වැඩවර්ජනයකට යන බව පුද්ගලික අංශයේ වෘත්තීය සමිතිය වන GSEE ඉඟි කලේය.

බොහෝ පැසොක් සාමාජිකයින්ගෙන් සැදුම්ලත් ADEDY සහ GSEE නායකත්වයන් පැපැන්ඩ්‍රියෝගේ කප්පාදු පිලිවෙත්වලට විරුද්ධ නැති අතර ප්‍රමානයෙන් අඩු කප්පාදුකිරීම් ක්‍රියාත්මක කරන්නට පැපැන්ඩ්‍රියෝට බලපෑම් දමන බංකොලොත් ඉදිරි දර්ශනයක් මත ඔවුන්ගේ විරුද්ධත්වය රඳ පවතී. වැඩ වර්ජන තවදුරටත් කරගෙනයාමට ඔවුන් ගත් තීරනය පැපැන්ඩ්‍රියෝගේ කප්පාදුකිරීම් නිසා වැඩිවන සමාජ අසහනයත්, වැටුප් සහ සමාජ වියදම් කඩාවැටීම් ගැන කම්කරු පන්තියේ වැඩෙන කෝපයත් නිරූපනය කරයි. වර්තමාන සංඛ්‍යාලේඛන වලට අනුව, මිලියන 11 ක් පමනක් ජීවත්වන රටෙහි දෙසැම්බරයේදී 69,000 ක රැකියා අහිමිවීමත් සමග, විරැකියාව ජනවාරියේදී සියයට 11.3 කට නැගුනි.

කම්කරු පන්තියේ වැඩෙන විරෝධයට මූල්‍ය වෙලඳපොලෙහි ප්‍රතිචාරය වී ඇත්තේ, තම ප්‍රහාරයන් පුලුල් කිරීමය. අසාධාරන පොලී අනුපාත අයකරමින් ග්‍රීසිය නටඹුන් බවට පත්කරන අන්දමින්ම, ඔවුහු අනෙකුත් යුරෝපීය රටවලටද එරෙහිව සමපේක්ෂනා වර්ධනය කරමින් සිටිති. ඔවුහු විශාල යුරෝපීය රටවල මහජන අරමුදල් මගින් වග කියනු ලබන රාජ්‍ය නය මත දැවැන්ත ලාබ ඉපැයීමේ අරමුනු පෙර දැරිව කටයුතු කරති.

ග්‍රීක ඇපදීමේ පැකේජයෙන් ධෛර්යමත්වන ආයෝජකයන්, "පෘතුගාලයෙන් පටන් ගෙන අනෙකුත් ආපදා සහගත යුරෝපා ආර්ථිකයන් බේරාගැනීම සඳහා යුරෝපයේ, විශේෂිතව ම ජර්මනියේ, කැමැත්ත පරීක්ෂාකරන" බව ගිය සතියේ *නිව්යෝක් ටයිම්ස්* නිරීක්ෂනය කලේය.

"රාජ්‍ය අංශයේ වැටුප් කප්පාදු හෝ ඉහල වැඩිකල අගය මත බදු වැනි, වැඩි කැපකිරීම් අවශ්‍ය බව දැනටමත් මිරිකුනු මහජනතාවකට ඒත්තු ගන්වන්නට පෘතුගාල දේශපාලකයන්ට දුෂ්කර කාර්යයක් වේවි." ලිපිය එකතු කලේය. කෙසේවුවද, "පෘතුගාලයට තම අයවැය හිඟය දදේනි යෙන් සියයට 9 කට කපාහරින්නට ඇති හැකියාව ගැන සැකකරන" නය අනුපාත වර්ගීකරන ඒජන්සියක් වන ෆිච් පෘතුගාලයේ රේට්ටුව පහල දමා ඇති බව *ටයිම්ස්* සටහන් කලේය.

පෘතුගාලයට සහ ග්‍රීසියට සමානව, එජ සහ එක්සත් රාජධානියේ අඩු ඉතිරිකිරීමේ අනුපාත පවතින අතරේ නය මූල්‍යකරනය කරන්නට ඔවුනට මුදල් නෝට්ටු මුද්‍රනය කලහැකි නමුත්, සුවිශේෂව ම උද්ධමනයට එරෙහි ජර්මනිය පිලිබඳව දන්නා යුරෝපා මහ බැංකුව, දිගු කාලීන ප්‍රතිපත්තියක් ලෙස මුදල් නෝට්ටු මුද්‍රනය කිරීම ප්‍රතික්ෂේප කරන බව ලිපිය එකතු කලේය.

එවැනි වැඩපිලිවෙලවල් ආයෝජකයන්හට දැවැන්ත ලාබ උපයාදෙමින් පෘතුගාලයේ නය ලබාගැනීමේ වියදම් ඉහල නංවන අතර, වේදනාකාරී සමාජ සහන සඳහා මහජනතාව පීඩනයට පත්කිරීමට දේශපාලකයන්ට ඉඩ ප්‍රස්තා සලසනු ඇත. ගිය සතිය තුල දස අවුරුදු පෘතුගාල රාජ්‍ය නය සඳහා අයකරන පොලී අනුපාත සියයට 0.25 කින් ඉහලයමින්, ඊයේ සියයට 4.61 කට ලඟාවිය.

අලුත්වුන "යුරෝපීය වසංගතයක්" ගැන අනතුරු අඟවන අතරේ, ගෝලීය අර්බුදයේ නව පරිච්ඡේදයක ඇරඹුම් ලක්ෂය ග්‍රීක අර්බුදය සනිටුහන් කරන බව සඳහන් කරමින් ජාමූඅ ඊයේ වාර්තාවක් එලිදැක්වීය.

ආර්ථික අර්බුදය හේතුවෙන්, කොටස් සහ දේපල වෙලඳාම් අංශයේ ඇති වූ සැලකිය යුතු බිඳ වැටීම නිසා බැංකුවලට ඩොලර් ට්‍රිලියන 2.3 ක් අහිමි වූ බව ජාමූඅ වාර්තා කලේය. එයින් ඩොලර් ට්‍රිලියන 1.5 ක් දැනටමත් කපා හැර ඇති අතර, එම සංඛ්‍යා සීඝ්‍රයෙන් ඉහල යා හැක. එජ ප්‍රාදේශීය බැංකු, ජර්මානු ලැන්ඩස්බැන්කන්, සහ ස්පාඤ්ඤ ඉතිරිකිරීමේ බැංකු වැනි දුර්වල බැංකුවල නයෙහි "සැලකියයුතු කොටස්" ඉතිරිව ඇති බව එය සඳහන් කලේය.

ලෝක මූල්‍ය ක්ෂේත්‍රය යටින් දිවෙන රාජ්‍ය නයබරෙහි අති විශාල මට්ටම් දෙස අවධානය යොමු කරන ජාමූඅ, රාජ්‍ය වියදම් කප්පාදුව හෙවත් "මූල්‍ය ඒකාග්‍රතාවයට" ආයාචනා කරයි. "ලෝක යුද්ධයක් නොමැතිව ම, දෙවන ලෝක යුද්ධයට පසුව ඇතිවූ තරමේ නය මට්ටම් දියුනු රටවල් සතුව පවතින" බව ජාමූඅ හි මූල්‍යමය සහ ප්‍රාග්ධන වෙලඳපොල දෙපාර්තමේන්තුවේ ප්‍රධානී ජෝසෙ විනාල්ස් සඳහන් කලේය.

මූල්‍ය රදල පැලැන්තිය විසින් යුරෝපීය සහ ලෝක ආර්ථිකයන් මත කල විනාශදායක වැරදි කලමනාකරනය එවැනි සංඛ්‍යාලේඛන මගින් ගෙනහැර දැක්වේ. ආර්ථික ක්‍රියාකාරකම් ආරක්ෂා කල හැකි ආර්ථික සහ කර්මාන්ත සැලසුම් ඔවුන් කිසිවෙකු සතුව නොමැති බව බලධාරීන් විසින් යෝජනා කෙරෙන වැඩපිලිවෙලවල් තුලින් පැහැදිලි ලෙසට ඉස්මතුකොට පෙන්වන අතර, ඊට විකල්පව ඒවා මහා සමාජ සහ දේශපාලන විපත්තියක් කරා මෙහෙයවමින් සිටී.

ජාමූඅ වාර්තාවට අනුව යමින්, ලේ මොන්ඩෙ වෙත සවිස්තර සාකච්ඡාවක් ලබා දෙන ජාමූඅ ප්‍රධාන ආර්ථික විශේෂඥ ඔලිවියර් බ්ලැන්කාර්ඩ්, අඩු පොලී අනුපාත ද ඇතුලත් වැඩි උද්ධමනකාරී ප්‍රතිපත්තියක් පසුපස මූල්‍ය බලධාරීන් යා යුතු බවට යෝජනා කලේය.

"සත්තකින්ම ග්‍රීසිය තමන්ම වැටුන වලෙන් ගොඩ ඒමට තම පටි තදකර ගත යුතුයි. නමුත් නය නැවත අය කර ගැනීම අපහසු කරවන ඉහල පොලී අනුපාතයන්ට නය ලබා දීම නිරර්ථකයි." වැටුප් සහ ආර්ථික ක්‍රියාකාරකම් බිඳවැටීම වලක්වන, "ඉහල සාමාන්‍ය උද්ධමන අනුපාතයක්" ඔහු යෝජනා කරන අතර, විශ්‍රාම වැටුප් කප්පාදුවත් සමග නය ආපසු ගෙවන්නට රටවලට පහසුවනවා ඇත.

ඩර් ස්පීගල් සමග පැවති සාකච්ඡාවකදී ජර්මානු මුදල් ඇමති වොල්ෆ්ගන් ෂෝබල්, 2008 සැප්තැම්බර් මූල්‍ය අර්බුදයට හේතු කාරක වූ ලේමන් බ්‍රදර්ස් කඩාවැටීම සමග ග්‍රීක නය පැහැරහැරීම සංසංදනය කලේය. ග්‍රීක ස්වාධීන මුලු නය එකතුව යූරෝ බිලියන 300 කට ඇස්තමේන්තු කර ඇත. "ග්‍රීක මුලු නය යූරෝ වලින් ඇති නමුදු, එම නය කුමන ප්‍රමානයක් කා හට අයිතිවන්නේදැයි පැහැදිලි නැත. ජාතික බංකොලොත්භාවයක ප්‍රතිපල ගනනය කල නොහැක. ග්‍රීසිය ප්‍රධාන බැංකුවක් ලෙසටම පද්ධතියක් ලෙස වැදගත්යැ"යි ඔහු පැවසීය.

කෙටියෙන් පැවසුවොත් ග්‍රීක නය පැහැරහැරීම, ග්‍රීසියට නය ලබාදුන් ප්‍රධාන එක්සත් රාජධානිය, ප්‍රන්ස, ස්විස්, සහ ජර්මානු බැංකු අතරේ විවෘත අරගල පැනනැගීමක් පමනක් නොව, පුලුල් මූල්‍ය කලබැගෑනියක තර්ජනය ඉස්මතු විය හැක.

බර්ලිනය "යටත්වූයේත්" ග්‍රීසියට ඇපදීමේ අරමුදලට සහායවන්නට පොරොන්දුවූයේත් ඇයි යනුවෙන් ඩර් ස්පීගල් විමසූවිට, "යටත්වීම" ප්‍රතික්ෂේප කරමින් ග්‍රීසියේ කප්පාදු සැලැස්ම "ප්‍රශංසනාත්මක" යැයි කල්පනා කල බව ඔහු පැවසීය. කෙසේවුවද, පෘතුගාලය, ස්පාඤ්ඤය හෝ වෙනත් යුරෝපීය රටවල් මේ හා සමාන ගැටලුවලට මුහුනපෑමේ අවදානම ගැන ප්‍රශ්නවලට උත්තර සැපයීම ඔහු ප්‍රතික්ෂේප කලේ එසේ කිරීම "අනුමාන සමපේක්ෂකරුවන්ගේ ව්‍යාපාරවලට රුකුල්දීමක්" යැයි පවසමිනි.

ග්‍රීසිය වැනි නය බරිත රටවල් පොදු මූල්‍ය සංගමයෙන් එලවාදැමීමට ක්‍රියාමාර්ග සකස්කරන බවට කල ඔහුගේ මුල් යෝජනාව ඔහු නැවත ඉදිරිපත් කලේය.

© www.wsws.org